සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2023 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2023-02-26
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** කාර්යක්ෂමතාවය යනු:

(1) නිවැරදි දේ කිරීම වේ.
(2) යමක් නිවැරදි අයුරින් කිරීම වේ.
(3) යෙදවුම් සහ නිමැවුම් අතර සම්බන්ධතාවය වේ.
(4) යෙදවුම්, නිමැවුම් බවට පත්කිරීම වේ.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, සේවකයෙකුට සඵලදායී පුහුණුවක් ලබාදීමෙන් ලැබෙන වාසියක් **නොවන්නේ** කුමක් ද?

(1) ඵලදායීතාවය ඉහළ යාම.
(2) ඉහළ සුපරීක්ෂණයක් අවශ්‍ය වීම.
(3) චිත්ත ධෛර්යය වර්ධනය වීම.
(4) අනතුරු අවම වීම.

**1.3** තරඟකරුවන්ට සාපේක්ෂව නිෂ්පාදිතයක සන්නමක් සම්බන්ධයෙන් පාරිභෝගික සංජානනයට / දැක්මට (perception) බලපෑම් කිරීමේ හැකියාව හඳුන්වනු ලබන්නේ:

(1) ස්ථානගත කිරීම (Positioning).
(2) ඉලක්කගත කිරීම (Targeting).
(3) ඛණ්ඩනය කිරීම (Segmentation).
(4) ඒකාබද්ධ කිරීම (Integration).

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් අතිරික්තය සඳහා වන උපායමාර්ගයක් වන්නේ කුමක් ද?

(1) අතිකාල වැඩ කිරීම.
(2) පූර්ණකාලීන සේවකයින් බඳවා ගැනීම.
(3) උපකොන්ත්‍රාත්තු ලබා දීම.
(4) සේවය අවසන් කිරීම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානමය නිර්මාණයකට (design) බලපාන සාධකයක් වන්නේ කුමක් ද?

(1) සංවිධානයේ ප්‍රමාණය (size).
(2) උපායමාර්ගය.
(3) තාක්ෂණය.
(4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක **1.6** සිට **1.10** දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.6** …………………… *(විශේෂඥ බලය / නීත්‍යානුකූල බලය)*, සංවිධාන ධූරාවලියේ පුද්ගලයෙකුට හිමි තනතුර මත පදනම් වේ.

**1.7** …………………… *(විකුණුම් / නිෂ්පාදිත)* සංකල්පයේදී, පාරිභෝගිකයින් නිෂ්පාදිතයන්හි ඉහළ ගුණාත්මකභාවය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**1.8** …………………… *(අධිකාරීත්වය / වගවීම)* යනුවෙන් අදහස් වන්නේ එකඟ වූ අපේක්ෂිත කාර්යසාධනයට අදාල වගකීම ගැනීම සහ ඒ කෙරෙහි ඇති බැඳීමයි.

**1.9** …………………… *[පාරිභෝගිකයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම / මිල යුද්ධය (Price war)]*, සදාචාර සම්පන්න අලෙවිකරණ මූලධර්මයක් සඳහා උදාහරණයකි.

**1.10** …………………… *(ජීවන වියදම / රැකියාවේ වටිනාකම)* යනු ප්‍රතිලාභයන්හි අභ්‍යන්තර තීරකයකි.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක **1.11** සිට **1.15** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** සංවිධානයකට, සන්නම්කරණය වැදගත් වීමට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** ප්‍රතිප්‍රේරණය වූ / අභිප්‍රේරණය නොවූ (demotivated) සේවකයෙකුගේ ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** සංවිධානයක් විසින් බාහිරින් සේවකයින් බඳවා ගැනීමට වඩා අභ්‍යන්තරයෙන් බඳවා ගැනීමට නැඹුරු වීමට හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** සඵලදායී බණ්ඩනය සඳහා අවශ්‍යතාවයන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.15** ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ඉංජිනේරුකරණයේ (Business Process Re-engineering) ප්‍රධාන ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස
(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

වර්තමානයේදී, පාරිසරික වෙනස්කම් හේතුකොටගෙන බොහෝ සංවිධානවල කළමනාකරුවන් තම ව්‍යාපාර කළමනාකරණයේදී විවිධ අභියෝගයන්ට මුහුණපානු ලබයි. එබැවින්, සුදුසු කළමනාකරණ පරිචයන් යෙදීමෙන් සහ ආයතනවල පැවැත්ම හා වර්ධනය සඳහා නව තාක්ෂණයන් සහ උපායමාර්ග අනුගමනය කරමින් තම ආයතන කළමනාකරණය කිරීමේ වගකීම කළමනාකරුවන් සතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තොරතුරු තාක්ෂණය, නවීන ව්‍යාපාරික ලෝකයේ අභියෝගයක් වී ඇති ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) විද්‍යාත්මක කළමනාකරණ න්‍යායයේ මූලධර්ම දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(c) උපායමාර්ගයක කාර්යභාරයන් (roles) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

සැලසුම් කිරීම, කළමනාකරණයේ පළමු හා වඩා වැදගත්ම කාර්යය වේ. එය කළමනාකරණයේ සෑම මට්ටමකදීම අවශ්‍යවන අතර, ආයතනික මට්ටමේදී තාර්කික තීරණ ගැනීමට සහාය වේ. සංවිධානයක් නිසිලෙස සැලසුම් සකස් කළද, සැලසුම් කිරීමේදී බාධාවන් පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ (rational decision-making process) පියවරයන් (steps) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ව්‍යාපාර ආයතනයක ඇති සැලසුම් වර්ග (types) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධක මැඩපැවැත්විය හැකි ආකාර (ways) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ පැවති වසංගතය සහ ඉන්ධන අර්බුධය, සංවිධානවලට එහි සංවිධාන ව්‍යුහය සහ උපායමාර්ග පිළිබඳ නැවත සිතා බැලීමට සහ ප්‍රතිනිර්මාණය කිරීමට මග පෑදුණි. මෙම වෙනස රැඩිකල් (radical) වන අතර, කළමනාකරුවන්ට ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව නැවත සිතා බැලීමට අවශ්‍ය වනු ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක ශ්‍රිතීය ව්‍යුහයේ (functional structure) පවතින අඩුපාඩු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සංවිධාන ව්‍යුහය සහ උපායමාර්ග අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාවේ අද පවතින තත්ත්වය තුළ මෙහෙයුම් කළමනාකරණයේ කාර්යභාරයන් (roles) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

වාචික සහ ලිඛිත සන්නිවේදන ක්‍රම සංවිධාන තුළ පොදුවේ දක්නට ලැබේ. උපායමාර්ග සඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේදී, ආයතනයක් තුළ ඇති සඵලදායි සන්නිවේදනය ඉතා වැදගත් වේ. තවද, සඵලදායි සන්නිවේදනය මගින් ආයතනයක පාලන කාර්යයන් ඉටුකිරීමට පහසුකම් සපයනු ලැබේ. කෙසේවුවද, බොහෝ කළමනාකරුවන්ට යම් යම් බාධාවන් නිසා තම ආයතන තුළ සඵලදායි සන්නිවේදන පද්ධතියක් පවත්වාගත නොහැකි වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයකට සඵලදායි සන්නිවේදනය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**.
(ලකුණු 06)

(b) පාලනයේ (controlling) ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

වෙළෙඳපොළ ඉල්ලුම නිරන්තරයෙන් සපුරාලීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු අතර, අර්බුධකාරී කාලපරිච්ඡේදය තුළ එය අභියෝගාත්මක කාර්යයකි. කෙසේවුවද, නිෂ්පාදන ක්‍රියාවලියේ සඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය පවත්වා ගැනීමට මෙහෙයුම් කළමනාකරණය උපකාරී වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක ඵලදායිතාවය (productivity) වැඩිදියුණු කරගන්නා ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න**.
(ලකුණු 04)

(b) පහත සඳහන් කාර්යයන් සංවිධානයක මෙහෙයුම් කළමනාකරණයේදී වැදගත් වන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න**:

(i) සැපයුම් දාම කළමනාකරණය. (ලකුණු 02)

(ii) තත්ත්ව කළමනාකරණය. (ලකුණු 02)

(c) මෙහෙයුම් කළමනාකරණයේදී ඉල්ලුම පුරෝකථනය කිරීමේ වැදගත්කම් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

ආර්ථික අර්බුධයෙන් ඉක්මනින්ම ගොඩඒමට නම්, රටම අපනයන හා සම්බන්ධ ව්‍යාපාරයන් කෙරෙහි අවධානය යොමුකළ යුතු බව ශ්‍රී ලංකාවේ අළුතෙන් පත්වූ ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරන ලදි. මෙය කුඩා හා මධ්‍ය-පරිමාණ ව්‍යාපාර ආයතනවලට අපනයන වෙළෙඳපොළ වෙත නැඹුරු වීමටත් ඩොලර් උපයා ගැනීමටත් අවස්ථාව උදා කරවන ලදි.

**ඩිලන්ත,** බස්නාහිර පළාත තුළ දේශීය පළතුරු සැපයුම්කරුවෙකු වන අතර, ඔහු විසින් එක් පළතුරු වර්ගයක් පමණක් සපයමින් කුඩා පරිමාණයෙන් ආරම්භ කළ මෙම ව්‍යාපාරය අද වනවිට සතියක් තුළ විවිධ වර්ගයන්ගෙන් තොග සැපයීමට හැකියාව ඇති මට්ටමට වර්ධනය වී ඇත. ඔහුගේ බොහෝ ව්‍යාපාරික ගනුදෙනු පුද්ගලික හැඳුනුම්කම් සහ දිගුකාලීන සම්බන්ධතාවයන් මත පදනම්ව ඇති බැවින් අලෙවිකරණය ආශ්‍රිත කටයුතු සඳහා මුදල් වැයකිරීමක් අවශ්‍ය නොවේ. නිෂ්පාදිත, අපනයනය කිරීමේ අදහසින් ඔහු ජාත්‍යන්තර ප්‍රජාව සම්බන්ධ කරගැනීමේ මාර්ගයක් ලෙස සමාජ මාධ්‍ය වේදිකාවක් (social media platform) සංවර්ධනය කරලීමටත්, විවිධ සමාජ මාධ්‍ය නාලිකාවන් භාවිත කරමින් ඔහු විසින් ශ්‍රී ලංකාව තුළ සිදුකරන ඇ පෙන්වමින් අලෙවිකරණ සහ විකුණුම් කටයුතු සිදුකිරීමටත් සැලසුම් කරමින් සිටී. සම්ප්‍රදායික පුද්ගලයෙකු වන **ඩිලන්ත** සම්ප්‍රදායික අලෙවිකරණ ක්‍රම පිළිබඳව දැඩි ලෙස විශ්වාසය තබයි. එබැවින්, ඔහුට මෙම අදහස පිළිබඳව යම් සැකයක් ඇති අතර, අලෙවිකරණ කටයුතු ඉදිරියට කරගෙන යාමට ප්‍රථම මේ පිළිබඳව පර්යේෂණයක් කිරීමට ඔහුට අවශ්‍යව ඇත.

**ඩිලන්ත** සිය ව්‍යාපාරයට සැලකිය යුතු ආයෝජනයක් කිරීමට කැමැත්තෙන් පසුවන අතර, වෙනත් වෙළෙඳපොළ සඳහා පළතුරු අපනයනය කිරීමට අමතරව දේශීය සහ විදේශීය වෙළෙඳපොළ සඳහා පළතුරු බිම් නිෂ්පාදනය කිරීමට ඔහු සැලසුම්කොට ඇත. ඔහුගේ අපේක්ෂාව වනුයේ පාරිභෝගිකයින්ට ප්‍රමුඛත්වය ලබා දී තම නිෂ්පාදන වැඩි දියුණු කරමින් අපනයන පිළිබඳ අවධානය යොමුකිරීම වේ.

ආයතනයේ මෙම නව සංවර්ධන කටයුතු සමඟින් පැනනගින අතිරේක වැඩකටයුතු, පවතින වැටුප් යටතේ කරගෙන යාම පිළිබඳවත් ආයතනයේ මානව සම්පත් ධාරිතාවය පිළිබඳවත් සේවකයින් කනස්සල්ලෙන් පසුවේ. එබැවින්, මෑත කාලීන සංවිධානමය වෙනස්කම් හේතුකොටගෙන ආයතනයට මානව සම්පත් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත. නව ව්‍යාපාර කටයුතු සහ නවීන තාක්ෂණය යොදාගනිමින් දේශීය ව්‍යාපාරය ජාත්‍යන්තර තත්ත්වයට කෙසේ පත් කරන්නේද යන්න පිළිබඳ **ඩිලන්ත** වැඩි නැඹුරුතාවයක් දක්වයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **ඩිලන්තගේ** ව්‍යාපාරය ජාත්‍යන්තර වශයෙන් වර්ධනය කරගැනීමට සඵලදායී අලෙවි කළමනාකරණය උපකාර වන ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) උපායමාර්ගයක් සංවර්ධනය කිරීමේදී ශදඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් **ඩිලන්ත** විසින් පාරිසරික විශ්ලේෂණය පිළිබඳව සළකා බැලිය හැකි ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා අනුගමනය කළ යුතු පියවර **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(d) යෝග්‍ය ප්‍රතිලාභ කළමනාකරණ පද්ධතියක අරමුණු තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(e) සේවකයින් වෙනස පිළිගැනීමට පෙළෙඹවීම සඳහා **ඩිලන්තට** භාවිත කළ හැකි ක්‍රම තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| ඇනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |